# බලාගාරය නැරඹීමට පැමිණෙන්නන් සඳහා උපදෙස්

1. බලාගාරය නැරඹීමට පැමිණෙන සියලුම දෙනා අවසර ලබාදීමේ ලිපිය සහ තම අනන්‍යතාවය ආරක්ෂක අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.
2. නරඹන්නන් සියලුම දෙනා ආයතනයේ ආරක්ෂක නීතිරීති හා උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
3. බලස්ථානය නැරඹීම සඳහා පෙ.ව.9.00 සිට ප.ව.16.00 දක්වා පමණක් අවසර ලබාදෙන අතර ප.ව. 16.00 ට පෙර බලස්ථාන භූමියෙන් ඉවත් විය යුතුය.
4. රාජකාරිමය හා ආරක්ෂක හේතූන් මත බලස්ථානය නැරඹීම පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට සිදුවිය හැක.
5. නරඹන්නන් සියලු දෙනා බලාගාර භූමිය තුළට සංවර ඇඳුමින් සැරසී පැමිණිය යුතු අතර විනීතව හා සංවරව හැසිරිය යුතුය.
6. නරඹන්නන් භාරව සිටින නිලධාරියා විසින් ලබා දෙන උපදෙස් පමණක් පිළිපැදීමට වගබලාගත යුතු අතර තම අභිමතය පරිදි හැසිරීමෙන් වැළකී සිටිය යුතුය.
7. බලාගාර භූමිය තුළ දී තම ආරක්ෂාව තමන් විසින් දැරීමට වග බලාගත යුතුය.
8. නම් කර ඇති අනතුරු සහිත ස්ථාන වලට යොමු නොවිය යුතුය.
9. බලාගාරයේ සවි කර ඇති අනතුරු ඇඟවීම් හා වෙනත් සංඥා පුවරුවල ඇති උපදෙස් අනුගමනය කළ යුතුය.
10. බලාගාරයේ ඇති කිසිදු උපකරණයක්/ස්විචයක් අතින් ඇල්ලීම හෝ ක්‍රියාත්මක කිරීම නොකළ යුතුය.
11. කැමරා/වීඩියෝ කැමරා,ජංගම දුරකථන,ගමන් මලු බලාගාර පරිශ්‍රය තුළට ගෙන ඒම සපුරා තහනම් වේ.
12. මත්පැන් පානය කර බලාගාරයට ඇතුල්වීම හා බලාගාරය තුළ දුම්පානය සපුරා තහනම් වේ.
13. බලාගාරයට අත දරුවන් ගෙන ඒමෙන් වැළකිය යුතුය. (කුඩා දරුවන් රැගෙන ඒම අනතුරුදායකයි)
14. බලාගාරයට අයත් දේපල/උපකරණ වලට හානියක් නොවන පරිදි කටයුතු කිරීමට වග බලා ගත යුතුය.
15. නරඹන්නන් සඳහා වන අනතුරු සම්බන්ධයෙන් කිසිදු වගකීමක් බලාගාර නිලධාරීන් විසින් දරනු නොලැබේ.
16. නරඹන්නන්ගේ පෞද්ගලික වාහන බලාගාරය තුළට ඇතුල් කිරීමට අවසර ලබා නොදෙන අතර එම වාහන ප්‍රධාන දොරටුවෙන් පිටත ගාල් කළ යුතුය.
17. නරඹන්නන් බලාගාර භූමිය හා අවට පරිසරයට හානියක් නොවන අයුරින් කටයුතු කළ යුතුය.